මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

## වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය (TNSWSP)

# රැකියා පුරප්පාඩු නිවේදනය

**හැඳින්වීම**

දේශසීමා මායිම් ආශ්‍රිත වෙළඳ කටයුතු නියාමනය කිරීමේ නියෝජිතායතන වෙත වෙළඳුන් විසින් දේශසීමා මායිම් හරහා සිදුවන සිය වෙළඳ ප්‍රවාහයන් (ආනයන, අපනයන හා ප්‍රතිනැව්ගත කිරීම්) පිළිබඳ ලේඛන හා දත්ත අවශ්‍යතා ඉදිරිපත් කිරීම සඳහා තනි ප්‍රවේශ කේන්ද්‍රයක් වශයෙන් වෙළඳ ජාතික තනි කවුළු පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් තීරණය කර තිබේ. එවැනි ක්‍රියාවලියක ප්‍රතිඵල ද අයදුම්කරුවන් වෙත ස්වයංක්‍රීය වෙළඳ ජාතික තනි කවුළුවක් හරහා දැන්විය යුතු ය.

ඒ අනුව, මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් යෝජිත වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා එකී කාර්යය උදෙසාම වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයක් (PIU) ස්ථාපනය කිරීමට සහ වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතියේ යෝජිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය සඳහා රජයේ සේවයේ දැනට නියුක්ත සේවක පිරිස අතුරින් පහත සඳහන් තනතුරු සඳහා වඩාත්ම සුදුසුකම් සපුරා ලූ අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවීමට තීරණය කර තිබේ;

| අනු අංකය | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 1 | **කළමනාකරණ සහකාර** | **01** |
| 2 | **ගිණුම් සහකාර** | **01** |
| 3 | **රියදුරු** | **01** |
| 4 | **කාර්යාල කාර්ය සහායක** | **01** |

**සුදුසුකම්**

### 1) කළමනාකරණ සහකාර

- රජය විසින් පිළිගනු ලබන ආයතනයකින් මානව සම්පත් හෝ ව්‍යාපාර /රාජ්‍ය පරිපාලන, හෝ අදාළ ක්ෂේත්‍රයක ඩිප්ලෝමාවක් හෝ ඊට ඉහළ වෙනත් සුදුසුකමක් ලබා තිබීම; **සහ**
- රජයේ ආයතනයක පරිපාලන කටයුතුවලට අදාළව අවම වශයෙන් වසර 06ක පළපුරුද්ද; **සහ**
- ලිපිගොනු කළමනාකරණය, වාර්තා ලිවීම හා ලේඛන පවත්වා ගැනීම සම්බන්ධයෙන් පළපුරුද්ද අනිවාර්යවේ;
- ඉහළ මට්ටමේ පරිගණක සාක්ෂරතාවය (අවම වශයෙන් මාස 06ක කාල සීමාවක පරිගණක පාඨමාලාවක් හදාරා තිබිය යුතු ය);
- මනා සන්නිවේදන කුසලතා;
- ඉංග්‍රීසි භාෂාව හැසිරවීම සම්බන්ධයෙන් ඉහළ මට්ටමක හැකියාව.

**2) මුදල් සහකාර**

- රජය විසින් පිළිගනු ලබන ආයතනයකින් මුදල් හෝ ගිණුම්, හෝ අදාළ ක්ෂේත්‍රයක ඩිප්ලෝමාවක් හෝ ඊට ඉහළ වෙනත් සුදුසුකමක් ලබා තිබීම; **සහ**
- රජයේ ආයතනයක මූල්‍ය කටයුතුවලට අදාළව අවම වශයෙන් වසර 06ක පලපුරුද්ද; **සහ**
- මූල්‍ය වාර්තා පිළියෙළ කිරීම, මූල්‍ය වාර්තා විශ්ලේෂණය, වැටුප් පිළියෙල කිරීමේ කටයුතු හා ගිණුම් සම්බන්ධිත අදාළ අනෙකුත් කටයුතු පිළිබඳ පළපුරුද්ද අනිවාර්යවේ;
- ඉහළ මට්ටමේ පරිගණක සාක්ෂරතාවය (අවම වශයෙන් මාස 06ක කාල සීමාවක පරිගණක පාඨමාලාවක් හදාරා තිබිය යුතු ය);
- මනා සන්නිවේදන කුසලතා;
- ඉංග්‍රීසි භාෂාව හැසිරවීම සම්බන්ධයෙන් ඉහළ මට්ටමක හැකියාව.

**3) කාර්යාල කාර්ය සහායක**

- රජයේ ආයතනයක කාර්යාල කාර්ය සහායෙකු වශයෙන් අවම වශයෙන් වසර 06ක පළපුරුද්ද.

**4) රියදුරු**

- රජයේ ආයතනයක රියදුරෙකු වශයෙන් අවම වශයෙන් වසර 06ක පළපුරුද්ද.

**පොදු කොන්දේසි**

- 2024.04.26 වන දිනට වයස අවුරුදු 57ට නොවැඩි විය යුතු ය.
- වාර්ෂික කාර්යසාධන ඇගයුම මත පදනම්ව වාර්ෂිකව කොන්ත්‍රාත්තුව දීර්ඝ කිරීමට යටත්ව, මාස 36ක කාල සීමාවක් සඳහා අයදුම්කරුවන් කොන්ත්‍රාත් පදනමින් බඳවා ගනු ලැබේ.
- 2024.04.26 වන දිනට හෝ ඊට පෙර අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරාලිය යුතු ය.
- පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් සතු ය.
- මෙහි සඳහන් නොවන හෝ බඳවා ගැනීමේ ක්‍රියාවලිය තුළ පැන නගින යම් ගැටලුවක් සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් හා එකම තීරණය වේ.
- 2019 මාර්තු 05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව වැටුප් හා අනෙකුත් ප්‍රතිලාභ හිමි වේ.

**අයදුම්කිරීමේ ක්‍රමවේදය**

මෙම දැන්වීමට යා කොට ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙළ කළ අයදුම්පත් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් විසින් ස්වකීය ආයතන ප්‍රධානීන් හරහා 2024.04.26 වැනි දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑල ඔස්සේ යොමු කළ යුතු ය. අනෙකුත් ලේඛන සමග අයදුම්පත අඩංගු කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ විසින් ඉල්ලුම්කරන තනතුර සඳහන් කළ යුතු ය.

**ලිපිනය:**
**අධ්‍යක්ෂ ජනරාල්**
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
මහ ලේකම් කාර්යාලය
කොළඹ 01.

කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර අයදුම්පත සමඟ අදාළ සියලු ලේඛන අසම්පූර්ණ ලෙස ඉදිරිපත් කිරීම තනතුර සඳහා නොසුදුසු වීමට හේතුවක් වනු ඇත.

**ලේකම්**
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
දිනය: 2024.04.05